ශීර්ෂය 281 - ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

----

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1. **තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 281 - ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 ජූලි 15 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම**

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස් කර ඇත. එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 **මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි

ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැදුම් ප්‍රකාශය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම	නිර්දේශය
රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් බි ගිණුමේ දෙපාර්තමේන්තු පාලන ගිණුමේ ශේෂය රු.442,512,841 ක් වුවද කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එම ශේෂය රු.439,016,164ක් වූයෙන් රු.3,496,677ක වෙනසක් නිරීක්ෂණය විය.	මෙම වෙනස දීර්ඝ කාලයක සිට පැවත එන හඳුනා ගත නොහැකි හර ශේෂයන් වන අතර, 2024 වර්ෂයේදී මින් නිරවුල් කර ඇති ශේෂ හඳුනා ගෙන පොත් වලින් ඉවත් කළ අතර එය පාලන ගිණුමට, එම අදාල වර්ෂවලම බැර වී ඇති බැවින් පාලන ගිණුමට නැවතත් ගැලපීමට නොහැක. මෙම කරුණ සම්බන්ධයෙන් කෘෂිකර්ම අමාත්‍යාංශය සහ මුදල් අමාත්‍යාංශය වෙතින් ලද උපදෙස් ප්‍රකාරව නිරවුල් කිරීමට සැලසුම් කර ඇත.	ශේෂ වර්ගීකරණ සාරාංශයේ වෙනස හඳුනාගෙන නිරවුල් කළ යුතුය.

(ආ) දේපල පිරියත හා උපකරණ

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම	නිර්දේශය
2023 මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ වර්ෂ අවසාන ශේෂය 2024 වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස ඉදිරියට ගෙන ඒමේදී රු.10,864,561,544 ක් වැඩියෙන් ගිණුම් වල දක්වා තිබුණි.	මේ වනවිට වත්කම් ගොනු අනුව ආරම්භක ශේෂය සහ භාණ්ඩාගාර වාර්තා අනුව ආරම්භක ශේෂය නිවැරදිව සැසඳීම් කර ඇත. ඉදිරියේදී මෙවැනි තාක්ෂණික දෝෂ සිදු නොවන ආකාරයට උපකාර්යාල 26 ටම අදාළ මාසික වත්කම් ගොනු භාණ්ඩාගාරය වෙත වාර්තා කිරීමට පෙර පරීක්ෂා කර බලා අදාළ ඒකාබද්ධ වත්කම් ලේඛනයට ඇතුළත් කිරීමට කටයුතු කරනු ලැබේ.	මූල්‍ය නොවන වත්කම් වල ශේෂය නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.

(ඇ) අග්‍රිම ශේෂය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්විම	නිර්දේශය
අනෙකුත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් වාර්තා කරන ආයතනය විසින් එකතු කරන ලද රු.624,073,225 ක ශුද්ධ ආදායමක් අග්‍රිම සැසඳුම් ප්‍රකාශය යටතේ දැක්විය යුතු වුවත් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම් හා වෙනත් ප්‍රධාන ලෙජර ගිණුම් වියදම් යටතේ දක්වා තිබුණි.ඒ හේතුවෙන් 2024 දෙසැම්බර් 31 දිනට අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ ශේෂය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.	මෙය මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයේ වෙනත් ප්‍රධාන ලෙජර ගිණුම් ලැබීම් සහ වෙනත් ප්‍රධාන ලෙජර ගිණුම් ගෙවීම් අයිතමයක් ලෙස වටිනාකම දැක්වීමට ඉඩ තබා තිබුණ බැවින් එම වටිනාකම මූල්‍ය කාර්යය සාධනයේ පෙන්විය.2025 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශයේ නොදක්වා අග්‍රිම සැසඳුම් ප්‍රකාශයේ පෙන්නුම් කිරීමට කටයුතු කරනු ලැබේ.	ආදායම් හා වියදම් මූල්‍ය ප්‍රකාශන වල නිවැරදිව දැක්විය යුතුය.

2. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට
(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.2.2	මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයේ වර්ෂ අවසාන ශේෂය වර්ෂයේ ආරම්භක ශේෂය ලෙස ගිණුම්ගත කළ යුතුය.	1.6.1 (ආ)
1.6.1.3.(ආ)	දෙපාර්තමේන්තු පාලන ගිණුමේ ශේෂය හා කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ ශේෂයේ වෙනස නිවැරදි කළ යුතු ය.	1.6.1 (අ)

3. මූල්‍ය සමාලෝචනය

3.1 ආදායම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දෙපාර්තමේන්තුව සතු ගබඩා, ආපනශාලා හා සංචාරක බංගලා විධිමත්ව ගිවිසුම්ගත වී රජයට ලැබිය යුතු ආදායම් ලබානොගෙන සේවක සුභසාධක සංගම් හා ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත ඒවායේ ආදායම් ලබාගැනීමට අවස්ථා ලබාදීම හේතුවෙන් රජයට ලැබිය යුතුව පැවති ආදායම් අහිමි කර තිබුණි.	දෙපාර්තමේන්තුව සතු ගබඩා, ආපනශාලා හා සංචාරක නිවාස නඩත්තු හා අළුත්වැඩියා කටයුතු මෙන්ම සේවකයන් යෙදවීම සහ පරිපාලන කටයුතු සඳහා ඒකාබද්ධ අරමුදලේ ප්‍රතිපාදන වෙන්වීමක් සිදු නොවේ. කාරක සභා අරමුදල මගින් සියලු නඩත්තු කටයුතු හා අළුත්වැඩියා කටයුතු සිදු කරනු ලැබේ. එබැවින් අදාළ නඩත්තු වියදම් ප්‍රතිපූර්ණ කරගැනීම සඳහා එම සංචරක නිවාස ආදායම් කමිටු අරමුදලට බැර කිරීමට කටයුතු කර ඇත. නමුත් ඉදිරියේදී ක්‍රමවේදයක් සකස් කර එහි ආදායම රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කරනු ලැබේ.	රජයේ ඉඩම් හා ගොඩනැගිලි විධිමත් ගිවිසුම් ගත වීමෙන් බාහිර පාර්ශවයන් වෙත පැවරීමටත්,ඉන් ලැබෙන ආදායම් රජයේ ආදායමට බැර කළ යුතුය.

3.2 වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
සම්ප්‍රදායික වගාකරුවන් කෘෂි ව්‍යවසායකයින් බවට පත් කර අපනයන වෙළඳපල ඉලක්ක කර ගනිමින් කෘෂිකාර්මික කටයුතුවල ගොවීන් නිරත කරවීම අරමුණු	නාගොල්ලාගම ගොවිජන සේවා බල ප්‍රදේශයේ ඉදිකරන ලද හරිතාගාර	හරිතාගාර ඉදි කිරීමේදි අවබෝධතා

කර ගෙන 2023 හා 2024 වර්ෂවල කුරුණෑගල දිස්ත්‍රික්කයේ සුහුරු කෘෂි ගම්මාන වැඩසටහන ක්‍රියාත්මක කර තිබුණු අතර 2023 වර්ෂයේ ජූලි 25 දින ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හා පෞද්ගලික ආයතන 02ක් සමඟ ඇති කර ගෙන ඇති අවබෝධතා ගිවිසුමට අනුව හරිතාගාර ඉදිකිරීම,අස්වැන්න මිලදී ගෙන අපනයනය කිරීම හා කෘෂිකාර්මික උපදෙස් ගොවීන් වෙත සැපයීමට එකඟතා ඇති කර ගෙන තිබුණි.ඒ අනුව, නාගොල්ලාගම ගොවිජන සේවා බල ප්‍රදේශයේ ගොවීන් 21 ක් සඳහා හරිතාගාර 21 ක් ඉදිකිරීම වෙනුවෙන් රජයේ දායක වශයෙන් රු.10,500,000 ක් අදාළ ගොවිජන සේවා කාරක සභාව වෙත ද ගොවීන්ගේ දායක මුදල්ද ගොවිජන බැංකුව තුළ ද තැන්පත් කර තිබූ නමුත් හරිතාගාර නියමිත පිරිවිතරවලට අනුව ඉදි නොකිරීම හේතුවෙන් කොන්ත්‍රාත් සමාගම වෙත මුදල් ගෙවීම සිදු කර නොතිබුණි. එමෙන්ම, 2024 වර්ෂයේදී ගොවීන් 14 දෙනෙකුට හරිතාගාර ඉදිකිරීම සඳහා 2024 ජූනි 04 දින රු.18,000,000 ක ප්‍රතිපාදන ලැබී තිබුණද කිසිදු හරිතාගාරයක් ඉදි නොකර ඉන් රු.236,977 ක වියදම් දරා ඉතිරි රු.17,763,023 ක ප්‍රතිපාදනද ආපසු යවා තිබුණි. ඒ අනුව, මෙම ව්‍යාපෘතිය මඟින් අදාළ අරමුණු සඵල කර ගැනීමට නොහැකි වී තිබුණි.	සම්බන්ධයෙන් පැවති සාකච්ඡාව 2025.06.02 දින ප්‍රධාන කාර්යාලයේ දී ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් පෙ.ව.10.00 ට පැවැත්වීමට ද සූදානම්කර ඇත. එම සාකච්ඡාවේ තිරණවලට පසුව එම ඉදිකිරීම් සමාගම වෙත ගෙවිය යුතු මුදලක් වේ නම් ගෙවීම් කිරීම සඳහා හා ඉතිරි මුදල් පවතී නම් රාජ්‍ය ආදායමට බැර කරන ලෙස උපදෙස් ලබාදීමට නියමිතය. 2024 වර්ෂයේ ප්‍රතිපාදන ලබාදෙන ලද හරිතාගාර ඉදිකිරීම් කටයුතු 2025.06.15 දිනෙන් අවසන් කිරීමට නියමිතය.	ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය.

3.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් දෙපාර්තමේන්තුව මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	දෙපාර්තමේන්තු මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යන අතර එම පද්ධතියේ සඵලදියීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඇතත් ඒ සම්බන්ධයෙන් විගණකාධිපති වෙත මේ දක්වා වාර්තා කර නොමැති අතර ඉදිරියේදී විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.	දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතුය.

3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

	නිරීක්ෂණය				
	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	වටිනාකම රු.	අනුකූල නොවීම	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 30 (2), (3), 32 (1) සහ 33 (1) වගන්ති		මුන්නේශ්වරම් ගොවිජන සේවා බල ප්‍රදේශයට අයත් වසම් දොළහක සිදුකළ නියැදි පරීක්ෂාවේ දී කුඹුරු ඉඩම් අක්කර 125.5 ක් වී වගාව හැර වෙනත් වගාවන් සඳහා භාවිතා කිරීමට කොමසාරිස් ජනරාල් වරයාගේ ලිඛිත අවසරය ලබාගෙන නොතිබුණි.	කොමසාරිස් ජනරාල් වරයාගේ හෝ අදාළ ගොවිජන සංවර්ධන නියෝජ්‍ය/සහකාර කොමසාරිස්ගේ හෝ අදාළ ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරීගේ ලිඛිත අවසරයකින් තොරව යම් කුඹුරු ඉඩමක වී වගාව හැර වෙනත් වගාවක් සිදු කරන්නේ නම්, 2011 අංක 46 දරන ගොවිජන සංවර්ධන (සංශෝධන)පනතින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව අවශ්‍ය නීතිමය ක්‍රියාමාර්ග ගැනීම අදාළ නියෝජ්‍ය/සහකාර කොමසාරිස්වරු විසින් සිදු කරයි.	කුඹුරු ඉඩමක් වී වගාව හැර වෙනත් වගාවන් සඳහා යොදා ගැනීමේදී විධිමත් අවසරයක් ලබාගත යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය I කොටසේ v වන පරිච්ඡේදය 4 වගන්තිය අනුව හා කාර්ය පරිපාටික රීති සංග්‍රහයේ xiv වැනි පරිච්ඡේදය	4,025,535	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් 71 ක ගෙන් අය විය යුතු රු.මිලියන 4.02 ක ණය අය කරගෙන නොතිබු අතර ඒ තුළ වර්ෂ 05 කට පෙර සේවය අතහැර ගිය නිලධාරීන් 40 ක ගෙන් අය විය යුතු ණය ශේෂය රු.මිලියන 2.25 ක් විය.	නිරවුල් නොවූ ශේෂ නිරවුල් කිරීමට නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සඳහා DAD/FIN/SAL/2/1 සමාංක හා 2025.3.21 දිනැති ලිපියෙන් දිස්ත්‍රික් කාර්යාල වෙතින් සහ පදිංචි තොරතුරු විමසා මැතිවරණ කොමිෂන් සභාව වෙතින් විමසා ඇත.	හිග ණය ශේෂ අයකර ගත යුතුය.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය				
මු.රෙ 571	25,353,990	වර්ෂ දෙක ඉක්මවූ තැන්පතු නියාදනය කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුමේ වසර දෙකක් ඉක්මවූ රු.මිලියන 25.35 ක තැන්පතු සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි.	2024.12.31 දිනට පොදු තැන්පතු ගිණුමේ වසර දෙකක් ඉක්ම වූ වටිනාකම අදාල ඉල්ලීම් තෙවන පාර්ශවයන් වෙතින් ලබා ගෙන භාණ්ඩාගාරයෙන් අක්මුදල් ලබා ගැනීමෙන් පසු ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ.	කල් ඉක්ම වූ තැන්පතු නියාදනය කළ යුතුය.
(ඈ) 1997 අගෝස්තු 19 දින අංක 26/92 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය සහ 1994 අගෝස්තු 03 දිනැති අංක 26/92(I) දරන චක්‍රලේඛය හා මු.රෙ. 750 (i)		සියලු සංචිත වාහනවල රාජ්‍ය ලාංඡනය සහ දෙපාර්තමේන්තුවේ නම පින්තාරු කළ යුතු වුවත් දෙපාර්තමේන්තුවේ කිසිදු සංචිත වාහනයක එසේ රාජ්‍ය ලාංඡනය සහ දෙපාර්තමේන්තුවේ නම යොදා නොතිබුණි.	සියලුම සංචිත වාහන සඳහා රාජ්‍ය ලාංඡනය සහ දෙපර්තමේන්තුවේ නම පින්තාරු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.	සියලු සංචිත වාහනවල රාජ්‍ය ලාංඡනය සහ දෙපාර්තමේන්තුවේ නම පින්තාරු කළ යුතුය.
(ඉ) 2024 මැයි 20 දින කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයේ අංක CGO/NFAMS/01 /03 දරන ලිපිය		දෙපාර්තමේන්තුව සතු වාහන 16 ක් 2024 අගෝස්තු 31 දිනට පෙර අපහරණය කරන ලෙස දක්වා තිබුණද ඉන් වාහන 3 ක් තවදුරටත් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.	වාහන 16න් වාහන 08 අපහරණය කර ඇත.	වාහන අපහරණය කිරීමට කටයුතු කළ යුතුය.

3.5 අවිධිමත් ගනුදෙනු

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පාර්ලිමේන්තුවේ සම්මත කෙරෙන පනතකින් හැර වෙනත් කිසිදු ආකාරයකින් නව අරමුදල් ඇති කිරීම සපුරා තහනම් වන අතර මු.රෙ.876(3) ප්‍රකාරව ව්‍යවස්ථාපිත නොවන අරමුදල් වහාම ක්‍රියාත්මක වන පරිදි අහෝසි කොට ඒවායේ මුදල් ශේෂයන් ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වන අතර ව්‍යවස්ථාපිත නොවන අරමුදලක් තව දුරටත් පවත්වාගෙන යාමට සාධාරණ හේතු ඇත්නම්	ව්‍යවස්ථාපිත නොවන අරමුදල් වසා දැමීම හෝ තවදුරටත් පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රධානත්වයෙන් 2025.01.09 දින පැවති රැස්වීමේදී ගොවින්ගේ භාරකාර අරමුදල පිළිබඳව ද සාකච්ඡාවට භාජනය විය. එහිදි	මුදල් රෙගුලාසි ප්‍රකාරව ව්‍යවස්ථාපිත නොවන අරමුදල් අහෝසි කිරීම හෝ නීතිගත කිරීමට කටයුතු කළ යුතුය.

	එවැනි අරමුදල් පාර්ලිමේන්තු පනතක් මගින් නීතිගත කිරීමට කටයුතු කළ යුතු වුවත් ගොවි බැංකු අරමුදල සම්බන්ධයෙන් විගණිත දිනය දක්වා එසේ කටයුතු කර නොතිබුණි.ඒ අනුව 2022 වර්ෂයේදී රු.මිලියන 75 ක්ද 2023 වර්ෂයේදී රු.මිලියන 311 ක්ද 2024 වර්ෂයේදී රු.මිලියන 50 ක් ද ස්ථාවර තැන්පතු වල ආයෝජනය කර රු.මිලියන 29.92 ක පොලී ආදායමක් උපයා තිබුණි.	ගන්නා තීරණ අනුව ගොවින්ගේ භාරකාර අරමුදලේ ඉදිරි ක්‍රියාකාරිත්වය මත පදනම්ව ගොවි බැංකු ගිණුමේ ඉදිරි කටයුතු සම්බන්ධයෙන් තීරණ ගැනිමට සැලසුම් කර ඇත.	
(ආ)	2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 හා 04 ඡේදයන් ප්‍රකාරව ගොවි බැංකු අරමුදලේ ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලැස්ම සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ විධිමත් අනුමැතියකින් තොරව හා අදාල චක්‍රලේඛ විධි විධානයන්ට පටහැනිව දෙපාර්තමේන්තුව විසින් ගොවි බැංකු අරමුදලින් රු.8,272,268 ක ස්ථාවර වත්කම් මිලදී ගැනීමද රු.4,412,001 ක අළුත්වැඩියා වියදම් දැරීමද සිදු කර තිබුණි.	02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයට අනුව නව ගිණුමක් විවෘත කිරීමට 2000 සැප්තැම්බර් මස 28 වැනි දින කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය විසින් නිකුත් කර ඇති අත්වැල - I හි 6.2 පරිච්ඡේදයෙන් ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයා වෙත ලබාදී ඇති බලතල අනුව ගොවිජන බැංකු (නියමු) ව්‍යාපෘති වෙත ප්‍රාග්ධනය ලබාදිමෙන් ලද සියයට 1 ක ආදායම ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ අනුමැතිය මත හා ගොවිජන බැංකුවේ ගිණුමේ අනුමත කරන ලද ශීර්ෂ විස්තරය මත වියදම් දරා ඇති ආකාරය ඉදිරිපත් කර ඇත.	චක්‍රලේඛ විධි විධානයන්ට අනුව කටයුතු කළ යුතුය.

3.6 තැන්පත් ශේෂයන්

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්විම	නිර්දේශය
මාතර, කුරුණෑගල හා රත්නපුර යන දිස්ත්‍රික් කාර්යාලවල තාක්ෂණ නිලධාරියාගේ නිර්දේශ නොමැතිවීම හේතුවෙන් කොන්ත්‍රාත් රැඳවුම් ලෙස (16/9) රු.මිලියන 5.86 ක් වර්ෂ 02 සිට වර්ෂ 05 දක්වා කාලයක සිට පැවත එන අතර අදාළ කොන්ත්‍රාත්වල අඩුපාඩු ඇත්නම් එම අඩුපාඩු සම්පූර්ණ කරවාගෙන අදාළ රැඳවුම් මුදල් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	දින 07ක් ඇතුළත රැඳවුම් මුදල් නිදහස් කිරීමට හෝ රාජ්‍ය ආදායමට බැර කර අවසන් කිරීමට කටයුතු කරනු ලැබේ.	නියමිත පරිදි කොන්ත්‍රාත් රැඳවුම් නිදහස් කිරීම කළ යුතුය.

3.7 බැංකු ගිණුම් මෙහෙයවීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්විම	නිර්දේශය
(අ)	මුදල් රෙගුලාසි 188(2) හා (3) ප්‍රකාරව මුදල් බැංකුගත කිරීමේදි ඒ සඳහා බැංකු කුවිතාන්සි ලබා ගැනීමටත්,බැංකු ප්‍රකාශන වලින් ඒ මුදල් හරියාකාරව බැරවී තිබේ දැයි පරීක්ෂා කර බැලීමටත් වගකීම් භාර නිලධාරීන් විසින් සහතික විය යුතුය.මේ අනුව,දිස්ත්‍රික් කාර්යාල 03ක	නුවරඑළිය හා මාතලේ යන දිස්ත්‍රික්කවල රු.8,802,877ක් වටිනා ලැබීම් මේ වන විට හඳුනාගෙන ඇති අතර, ඉදිරියේදි නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ.	මුදල් බැංකුගත කිරීම පරීක්ෂා කර නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.

	දෙසැම්බර් මස බැංකු සැසඳුම් ප්‍රකාශ පරීක්ෂාවේ දී එකතු වටිනාකම රු.මිලියන 8.80 ක් වූ ලැබීම් සම්බන්ධයෙන් ඉහත මුදල් රෙගුලාසි වලට අනුව කටයුතු කර නොතිබුණි.		
(ආ)	මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව චෙක්පත් නිකුත් කළ දිනය, එය වලංගු කළ දිනය යන දෙකින් පසුව එළඹෙන දින සිට මාස 06 කට වැඩි කාලයක් එය මුදල් නොකර තිබේ නම් හෝ ලිපි වලට පිළිතුරක් එවා නොමැති නම් ද ඒ සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු වුව ද, දිස්ත්‍රික් කාර්යාල 07ක එකතු වටිනාකම රු.786,396ක් වූ චෙක්පත් 44 ක් සම්බන්ධයෙන් ඉහත මුදල් රෙගුලාසි වලට අනුව කටයුතු කර නොතිබුණි.	රු.786,396 ක් වන චෙක්පත් 44 සම්බන්ධයෙන් ඉදිරියේදී මුදල් රෙගුලාසි 396 අනුව කටයුතු කරනු ලැබේ.	චෙක්පත් නිකුත් කිරීමේදි සැලකිලිමත්ව කටයුතු කළ යුතුය.
(ඇ)	ලංකා බැංකුවේ 7042345 දරන බැංකු ගිණුමෙහි 2024 දෙසැම්බර් මාසයේ බැංකු සැසඳුම් ප්‍රකාශය අනුව එකතු වටිනාකම රු.මිලියන 5.37 ක් වූ චෙක්පත් 16 ක් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු නොකර හඳුනා නොගත් ලැබීම් ලෙස දක්වා තිබුණි.	රු.5,378,964ක් වන හඳුනානොගත් ලැබීම් 16 අතරින් රු.මිලියන 1.43 ක් වටිනා ලැබීම් 2 ක් නිරවුල් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.ඉතිරි වටිනාකම වන රු.මිලියන 3.94 ක් වන හඳුනානොගත් ලැබීම් 14 ක් හඳුනා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවති.	බැංකු ලැබීම් හඳුනාගෙන ගිණුම්ගත කිරීම කළ යුතුය.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දී ක්‍රියාකාරී සැලැස්ම අනුව කුඹුරු ඉඩම් වල කෙටිකාලීන අතුරුබෝග වගා කිරීම ව්‍යාපෘතිය යටතේ අක්කර 600 ක් වගා කිරීමට රු.මිලියන 12.48 ක ප්‍රතිපාදනයක් නිදහස් කර ඉන් රු.මිලියන 10.21ක වියදමක් දරා තිබුණද එහි ප්‍රගතිය වාර්තා කර නොතිබුණි.	පිළිතුරු සපයා නොමැත	නිදහස් කළ ප්‍රතිපාදන වල භෞතික ප්‍රගතිය කාර්ය සාධන වාර්තාවේ දැක්විය යුතුය.
(ආ)	ක්‍රියාකාරී සැලැස්ම අනුව සුළු වාරි මාර්ග නඩත්තු අරමුදල් ව්‍යාපෘති 200 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී රු.මිලියන 16.7 ක ප්‍රතිපාදනයක් නිදහස් කර රු.මිලියන 16.3 ක වියදමක් දරා තිබුණු ද ඉන් ව්‍යාපෘති 167 ක් පමණක් ක්‍රියාත්මක කර තිබුණි. සැලසුම් කළ ව්‍යාපෘති 200 න් ව්‍යාපෘති 33 ක් ඉටු කිරීමට කටයුතු කර නොතිබුණු අතර ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන්හි ප්‍රගතිය වාර්තා කර නොතිබුණි.	දිස්ත්‍රික්කවලින් යොමුකර ඇති ව්‍යාපෘති 33 ක් මාර්ගෝපදේශ උපදෙස්වලට අනුකූල නොවන බැවින් අනුමත නොකළ ව්‍යාපෘති ක්‍රියාත්මක නොකරන ලදී. ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතිවල ප්‍රගතිය මේවන විට වාර්තා කර ඇත.	අනුමත ව්‍යාපෘති ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර එහි ප්‍රගතිය වාර්තා කිරීම කළ යුතුය.

(ඇ)	ක්‍රියාකාරී සැලැස්ම අනුව සුහුරු ආදර්ශ කෘෂි ගම්මාන වැඩසටහන දිස්ත්‍රික්ක 19 ක ක්‍රියාත්මක කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කර තිබුණ ද ක්‍රියාත්මක කළ යුතු වාර්ෂික භෞතික ඉලක්ක ප්‍රමාණය සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් නොකර සමාලෝචිත වර්ෂයේ දී රු.මිලියන 263 ක ප්‍රතිපාදනයක් නිදහස් කර ඉන් රු.මිලියන 67.1ක වියදමක් දරා හරිතාගාර 18 ක් පමණක් ඉදිකිරීම ආරම්භ කර තිබුණි. ඉන් හරිතාගාර 7 ක ඉදි කිරීමේ ප්‍රගතිය සියයට 50 ක් වූ අතර ඉදිකිරීම් ආරම්භ කර තිබූ ඉතිරි හරිතාගාර 11 හි ප්‍රගතිය වාර්තා කර නොතිබුණි.ඒ අනුව, එම වැඩසටහන සමාලෝචිත වර්ෂය තුල සාර්ථකව ඉටු කර නොතිබුණි.	සුහුරු කෘෂි ගම්මාන වැඩසටහන යටතේ ඉදිකිරීමට ප්‍රතිපාදන නිදහස්කරන ලද ව්‍යාපෘති 2025.06.15 දිනට වැඩ අවසන් කිරීමට නියමිතය.	ක්‍රියාකාරී සැලැස්ම අනුව නියමිත කාලයේ දී ඉලක්කගත හරිතාගාර සම්පූර්ණ කිරීම කළ යුතුය.
(ඈ)	ක්‍රියාකාරී සැලැස්ම අනුව ඩිජිටල් කුඹුරු ඉඩම් නාමලේඛන සකස් කිරීමේ ව්‍යාපෘතිය යටතේ සමාලෝචිත වර්ෂයේ දී කුඹුරු ඉඩම් 1,600,000 ක් ලියාපදිංචි කිරීමට සැලසුම් කර රු.මිලියන 30 ක ප්‍රතිපාදනයක් වෙන්කර ඒ සඳහා රු.මිලියන 26.05ක ප්‍රතිපාදනයක් නිදහස් කර තිබුණි. එසේ වුවද ප්‍රතිපාදිත මුදලින් රු.මිලියන 25.06 ක් හෙවත් සියයට 96 ක වියදමක් දරා ලියාපදිංචි කර තිබූ කුඹුරු ඉඩම් ප්‍රමාණය 38,495 ක් වූ අතර එය ඉලක්කගත ප්‍රමාණයෙන් සියයට 2.4 ක අඩු අගයක් ගෙන තිබුණි.	ඩිජිටල් කුඹුරු ඉඩම් නාම ලේඛනය සකස් කිරීමේ ව්‍යාපෘතිය යටතේ 2024 වර්ෂයේ දී KML ගොනු 120,875 ක් පරීක්ෂාකර ඇති අතර රු.මිලියන 24.17 ක් ප්‍රතිපාදන ලෙස නිදහස් කර ඇත.	ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉලක්කගත ඩිජිටල් කුඹුරු ඉඩම් නාමලේඛන සකස් කිරීම සම්පූර්ණ කළ යුතුය.
(ඉ)	දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව පැරෂූට් වගා වැඩසටහන යටතේ දිස්ත්‍රික්ක 21ක අක්කර 10,000ක් වගා කිරීම සඳහා රු.මිලියන 241.4 ක ප්‍රතිපාදනයක් නිදහස් කර ඇතත්, රු.මිලියන 63.6 ක් හෙවත් ප්‍රතිපාදනයෙන් සියයට 26 ක් වියදම් කර අක්කර 613 ක් පමණක් වගා කර තිබූ අතර එය වගා කිරීමට ඉලක්කගත අක්කර ප්‍රමාණයෙන් සියයට 6.3 ක අඩු අගයක් ගෙන තිබුණි.	2024/25 මහ කන්නයේ පැරෂූට් වගා වැඩසටහන යටතේ දිස්ත්‍රික්ක 19 ක් සඳහා අක්කර 2,128 ක් සඳහා පැරෂූට් තැටි 3,559,936 ක් සඳහා රු.මිලියන 240.80 ප්‍රතිපාදන නිදහස්කර ඇත.	ක්‍රියාකාරී සැලැස්ම අනුව පැරෂූට් වගා වැඩසටහනේ ඉලක්කයන් සම්පූර්ණ කළ යුතුය.
(ඊ)	ක්‍රියාකාරී සැලැස්ම අනුව කැපුම් මල් වගාව සඳහා ආරක්ෂිත ගෘහ සකස් කිරීමේ ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 31.04 ක ප්‍රතිපාදනයක් නිදහස් කර ඉන් රු.මිලියන 29.92ක මුදලක් හෙවත් සියයට 96 ක් වැය කර තිබුණද සකස් කිරීමට ආරම්භ කරන ලද ආරක්ෂිත ගෘහ 30 වර්ෂය තුල නිම කිරීමට කටයුතු කර නොතිබුණි.	කැපුම් මල් වගාව සඳහා ආරක්ෂිත ගෘහ සකස් කිරීමේ ව්‍යාපෘතිවල ඉදිකිරීම් කටයුතු අවසන් අදියරයේ පවතින අතර ගොවීන් විසින් වගා කටයුතු ආරම්භ කිරීමට නියමිතය.	ක්‍රියාකාරී සැලැස්ම අනුව කැපුම් මල් වගා ව්‍යාපෘති ඉලක්කයන් සම්පූර්ණ කළ යුතුය.
(උ)	කුරුණෑගල දිස්ත්‍රික්කයේ 2024 දෙසැම්බර් 31 දිනට කුඹුරු ඉඩම් ලෙස ලේඛන ගත වී තිබූ ඉඩම් අතරින් A කාණ්ඩයට අයත් පුරන් කුඹුරු අක්කර 590.30 ක්ද, B කාණ්ඩයට අයත් පුරන් කුඹුරු අක්කර	මෙම පුරන් කුඹුරු ඉඩම් හඳුනා ගැනීම 2023 මහ කන්නයේ දී සිදු වූ අතර ඒ කාලයේ දී අනෙකුත් කුඹුරු ඉඩම් වගා	පුරන් කුඹුරු අස්වැද්දීමේ ඉලක්කයන් සම්පූර්ණ කිරීමට

	232.465 ක් ද, C කාණ්ඩයට අයත් පුරන් කුඹුරු අක්කර 833.78 ක් ද හඳුනාගෙන තිබුණද අදාළ කුඹුරු ඉඩම් නැවත අස්වැද්දීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	කටයුතු සිදුකර තිබූ බැවින් එම කන්නයේ දී වගා කටයුතු සිදු කිරීමට නොහැකි වී ඇත.	කටයුතු කළ යුතුය.
(ඌ)	පුරන් කුඹුරු අස්වැද්දීමේ ජාතික වැඩසටහන් යටතේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ 2023 වර්ෂය තුළදී මධ්‍යස්ථාන 27 ක අක්කර 215 ක ප්‍රමාණයක් අස්වැද්දීම සඳහා රු.මිලියන 8.06 ක් දිස්ත්‍රික් කාර්යාලය විසින් වැය කර තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මස 31 දින වනවිටත් ඉන් මධ්‍යස්ථාන 11 ක පුරන් කුඹුරු අක්කර 24.3045 ක වී වගා නොකර වැය කර තිබුණ රු.මිලියන 1.62 ක මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.	ස්වභාවික ආපදා තත්ත්වයන් මත මෙම ඉඩම්වල වගාවන් විනාශ වීම හේතුවෙන් වගා කිරීමට හැකියාවක් නොමැත.	පුරන් කුඹුරු අස්වැද්දීමේ ඉලක්කයන් සම්පූර්ණ කළ යුතුය.

4.2 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
නවීන තාක්ෂණය කෘෂිකාර්මික කටයුතු සඳහා යොදා ගැනීම හා අපනයන වෙළෙඳපොළ ඉලක්කගත කෘෂිකාර්මික වගාකරුවන්ගේ සංඛ්‍යාත්මක අගය වැඩි කිරීම යන විවිධ අරමුණු සහිතව කෘෂි ව්‍යවසායන් අරමුණු කරගෙන 2023 වර්ෂයේදී සුහුරු ගම්මාන වැඩසටහන යටතේ මූල්‍ය බෝග සඳහා ස්වයංක්‍රීය සංවේදක සහිත හරිතාගාර ඉදිකිරීම සඳහා ගොවිජන සේවා බල ප්‍රදේශ 02 ක ගොවීන් 13 ක් තෝරා ගෙන ඉදිකිරීම් කටයුතු සිදු කර තිබුණි. මෙම හරිතාගාර ඉදිකිරීම සඳහා එක් ගොවියෙකු සඳහා රජයේ දායකත්වය ලෙස රු.500,000 ක්ද, ගොවියාගේ දායකත්වය ලෙස රු.500,000 ක්ද ලෙස වැය කර රු.1,000,000 ක් වටිනා හරිතාගාර ඉදි කළ යුතුව පැවතුණි.2023 දෙසැම්බර් 29 දින සියලු අක්මුදල් නිදහස් කර 2023 දෙසැම්බර් 31 දිනට පෙර ගෙවීම් අවසන් කරන ලෙස දන්වා තිබුණ අතර ඒ අනුව ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය විසින් අදාළ ඉදිකිරීම් සම්පූර්ණ කර නොතිබියදීම එම මුදල් අදාළ ගොවිජන සේවා කාරක සභා වෙත ලබාදී තිබුණි. තවද මෙම ගොවීන්ගේ අස්වැන්න මිලදී ගන්නා බවට පෞද්ගලික ආයතනයක් සමඟ ගිවිසුම් ගතව තිබුණද, 2024/2025 වර්ෂයන්වලදී ගොවීන්ගේ අස්වැන්න එම ආයතනය විසින් මිලදී ගෙන නොතිබුණි. එසේම ඉහත ගිවිසුම්ගත ආයතනය විසින්ම වගාකරුවන්හට හඳුන්වා දී තිබූ App මෘදුකාංගයද අදාල ආයතනය විසින් මාස 04 ක් ඉක්මවීමටත් පෙර අතරමඟ නවතා දමා ඇති අතර, වගාකරුවන්ගේ අස්වැන්න අලෙවි කර ගැනීමට නොහැකි වීම නිසාද, 2024 වර්ෂය අවසාන වන විට සුහුරු ගම්මාන වැඩසටහනට අදාල මෘදුකාංග පද්ධතිය ක්‍රියානොකරන බව ගොවීන් පවසන ලදි. ඒ	සුහුරු කෘෂි ගම්මාන වැඩ සටහන යටතේ මූල්‍ය බෝග සඳහා ස්වයංක්‍රීය සංවේදක සහිත හරිතාගාර ඉදිකිරීම සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව , Sri Lanka Agripreneurs’ Forum හා Agro World (Pvt)Ltd යන ආයතන 03 ගිවිසුම්ගත මෙම ව්‍යාපෘතිය මඟින් හඳුන්වා දී ඇති App මෘදුකාංගයෙන් සේවාව ලබා ගැනීම සඳහා ඉදිකිරීම් නිරීක්ෂණය හා ඉදිකිරීමෙන් පසු බෝග උපදේශන සේවා සඳහා Agro World (Pvt)Ltd යන ආයතන වෙත ගෙවීම් කළ යුතුය. මෙම ගෙවීම් කටයුතු ගොවීන් විසින් සිදු නොකිරීම නිසා මෙම App මෘදුකාංගය ක්‍රියාත්මක වී නොමැත. මෙම හරිතාගාර කඩිනමින් ඉදිකර අවසන් කරන ලෙස ආයතන වෙත දන්වා ඇත.	සුහුරු ගම්මාන ව්‍යාපෘති වැඩසටහන නියමිත කාලය තුළ නිම කිරීමට කටයුතු කළ යුතුය.

අනුව, ව්‍යාපෘතියේ අරමුණ වූ අපනයන වෙළෙඳපොල ඉලක්කගත කෘෂිකාර්මික වගාකරුවන්ගේ සංඛ්‍යාත්මක අගය වැඩි කිරීම ඉටුවී නොතිබුණු අතර මෙම ව්‍යාපෘතිය අසාර්ථක වී තිබුණි. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හා අදාළ ආයතන අතර අවබෝධතා ගිවිසුමක් අත්සන් කර තිබුණද, එම අවබෝධතා ගිවිසුම් උල්ලංඝනය කර තිබියදී, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් අදාළ ආයතනය සම්බන්ධයෙන් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

4.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 47(4) උපවගන්තිය ප්‍රකාර වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසාන වී දින 180 ක් හෝ ඊට පෙර ප්‍රකාශයට පත් කළ යුතුය. 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් ආකෘතිය ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙල කළ යුතුව තිබුණි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව කාර්යසාධන වාර්තාව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කළ යුතුව ඇතත් දෙපාර්තමේන්තුව ඒ අනුව කටයුතු කර නොතිබුණි.	2023 වර්ෂයේ කාර්යසාධන වාර්තාව සකස්කළ අතර මේ වන විට මුද්‍රණය කිරීම සඳහා යොමු කර ඇත. 2024 වර්ෂයේ කාර්යසාධන වාර්තාව ද අමාත්‍යාංශ අනුමැතිය සඳහා යොමු කර ඇත.	වාර්ෂික කාර්ය සාධන වාර්තාව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කළ යුතුය.

4.4 විදේශ ආධාර ව්‍යාපෘති

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
ලෝක බැංකු ආධාර යටතේ කුඩා හා මධ්‍ය පරිමාණ ගොවීන්ගේ, ක්ෂේත්‍ර බෝග වගාකරුවන්ගේ බෝග ගබඩා කිරීම සඳහා 2021 වර්ෂය තුලදී රු.මිලියන 8.71 ක් වැය කර දිස්ත්‍රික්ක හයක මෙ.ටොන් 900 ක ධාරිතාවයෙන් යුත් ගබඩා 11 ක් ඉදිකර ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත පවරාදී තිබුණි. මෙම ගබඩා නිශ්කාර්යව පවතින අතර ගබඩා ඉදිකිරීමේ අරමුණ ඉටු වී නොමැති බව විගණනයේදී නිරීක්ෂණය විය. අවශ්‍යතා හඳුනාගැනීමෙන් තොරව ගබඩා ඉදිකිරීම මේ සඳහා හේතුවී තිබුණි. තවද අනුරාධපුර මැදවච්චිය ගොවිජන සේවා මධ්‍යස්ථානයේ රු.මිලියන 2.46 ක් වැය කර ඉදි කරන ලද ගබඩාවේ කටයුතු තවදුරටත් අවසන් කිරීමට කටයුතු කර නොතිබුණි.	මැදවච්චිය වෙනත් ක්ෂේත්‍ර බෝග ගබඩාව ඉදි කිරීම් ව්‍යාපෘතිය අමුද්‍රව්‍ය මිල ඉහළ යාම,මිල විචලනය වීම යන ගැටළුකාරී වාතාවරණය හමුවේ පාදම පමණක් සකස් කර අතරමඟ නතර කිරීමට සිදු විය. අදාළ කොන්ත්‍රාත්කරු විසින් CIDA Formula මිල විචලනයට එකඟව 2023.03.31 දිනට වැඩ අවසන් කළ නොහැකි බැවින් ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා කාලය දීර්ඝ කරන ලෙස කරන ලද ඉල්ලීමට කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් අනුමැතිය නොලැබුනු අතර සුදුසු ප්‍රතිපාදන මූලාශ්‍රයක් යොදාගෙන ව්‍යාපෘතිය සම්පූර්ණ කරන ලෙස අමාත්‍යාංශය උපදෙස් දී තිබුණි.එබැවින් කෘෂිකර්ම අමාත්‍යාංශයේ උපදෙස් හා අනුමැතිය පරිදි උක්ත ව්‍යාපෘතිය අවලංගු කරන ලදී. ඒ අනුව ඉදිරියේ දී නව ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ප්‍රතිපාදන ලද විට උක්ත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරනු ඇත.	ඉදි කරන ලද ගබඩා උපරිම ධාරිතාවයෙන් යුතුව ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය.

4.5 **වත්කම් කළමනාකරණය**

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මොණරාගල ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය සතු වාහන යන්ත්‍රෝපකරණ අයිතම 03 ක් භාවිතයට ගෙන නොතිබූ අතර, පුත්තලම දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා මධ්‍යස්ථාන 12 ක රජයේ නිවාස අතරින් නිවාස 09 ක් අළුත්වැඩියා කළ යුතු තත්වයේ පවතින අතර ඒවා අළුත්වැඩියා නොකිරිමෙන් නිවාස 05 ක් නිෂ්කාර්යව පැවතුණි.	අංක 51-7005 කැබ් රථය අළුත්වැඩියා කටයුතු සඳහා යොමු කර ඇත.නිල නිවාස අළුත්වැඩියා සඳහා පසුගිය වසරවල දී ඉල්ලුම් කළ ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් අළුත්වැඩියා කටයුතු සිදු කිරීමට නොහැකි වී ඇත.මෙම වර්ෂයේ ප්‍රතිපාදනවලින් අළුත්වැඩියා කිරීමට ඉල්ලුම් කර ඇති අතර අදාළ ප්‍රතිපාදන ලද පසු අළුත්වැඩියා කටයුතු සිදු කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබේ.	අළුත්වැඩියා කළ යුතු වත්කම් නියමිත කාලය තුළ අළුත්වැඩියා කළ යුතුය.
(ආ)	නාරාහේන්පිට මධ්‍යම ගබඩාවේ ටයර් ඌනතාවය සම්බන්ධයෙන් වන මු.රෙ. 104(1) "අ" පරීක්ෂණ සම්බන්ධයෙන් පත් කරන ලද පරීක්ෂණ මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද වාර්තාවේ නිරීක්ෂණ අනුව මු.රෙ. 105 යටතේ සියයට 25 ක අධිභාරයද එකතු කළ පසු මුළු අලාභයේ වටිනාකම රු.මිලියන 3.37 ක් බව දක්වා තිබුණි. එමෙන්ම ගබඩා භාරකරු විසින් මූලික විමර්ශන කණ්ඩායම වෙත ඔහු විසින් ලිඛිතව ලබාදුන් ටයර් පිළිබඳ ඌනතාවය පිළිගත් බව ප්‍රකාශ කර ඇති අතර එම වාර්තාවේ නිර්දේශය අනුව මෙම අලාභයට වගකිව යුතු නාරාහේන්පිට මධ්‍යම ගබඩාවේ ගබඩා භාරකරුගෙන් එකවර මුදලින් අයකර ගැනීමට නිර්දේශ කර ඇතත්, 2024 අගෝස්තු 16 දින දක්වා එම අලාභය අදාළ නිලධාරියාගෙන් අය කර ගෙන නොතිබුණි.	මූලික විමර්ශනයේ නිර්දේශ අනුව නිලධාරියාට විරුද්ධව චෝදනා පත්‍රයක් කෙටුම්පත් කර ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත 2024.03.12 දිනැති ව යොමු කරන ලදී. එසේම මු.රෙ 104 පරීක්ෂණ වාර්තාව ද 2024.05.30 දිනැති ව ලබා දී ඇති අතර සිදු වූ අලාභය ලෙස රු.මිලියන 3.37 ක් බව වාර්තාව අනුව අනාවරණය වේ. එම මුදල් කළමනාකරණ සේවා නිලධාරී ගෙන් අය කර ගැනීමට නිර්දේශ කර ඇත. අදාළ මුදල් ගෙවන ලෙසට නිලධාරියා දැනුවත් කර ඇත.විෂයගත ටයර් අස්ථානගත වීම සම්බන්ධයෙන් නාරාහේන්පිට පොලිසිය වෙත පැමිණිල්ලක් සිදු කර ඇති. එහෙත් 2025.05.20 දින වන විටත් සැකකරුවකු අත්අඩංගුවට ගෙන නොමැති බැවින් විමර්ශන කටයුතු කඩිනමින් ඉටු කර දෙන ලෙස කොළඹ දකුණ ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි වෙත 2025.05.20 දින දැනුවත් කර ඇත.	ඌනතාවය අදාළ නිලධාරියාගෙන් අය කර ගත යුතුය.
(ඇ)	බස්නාහිර පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය - කළුතර මඟින් ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත 2006 වර්ෂයේදී ලබාදී තිබූ අත්ට්‍රැක්ටර් 16 ක් මේ වන විට භාවිතයට ගත නොහැකි ලෙස අබලන්වී තිබුණු අතර එම ට්‍රැක්ටර් ගොවිජන සේවා මධ්‍යස්ථාන වල ගාල් කර තිබීම හේතුවෙන් එම ආයතන	පිළිතුරු සපයා නොමැත.	භාවිතයට ගත නොහැකි ට්‍රැක්ටර් අපහරණය කළ යුතුය.

	පරිශ්‍රවල ඉඩකඩ ප්‍රශ්නද පැන නැගී ඇති අතර ට්‍රැක්ටර් අපහරණය කිරීමට කඩිනම් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.		
(ඇ)	දෙපාර්තමේන්තුව නමින් ලියාපදිංචි වී නොමැති වාහන 8 ක් පවරා ගැනීමට හෝ අදාළ ආයතනවලට ලබාදීමට කටයුතු කර නොතිබුණි. ඇතැම් වාහන භාවිතා කළ නොහැකි තත්ත්වයේ පැවති අතර ඒවා පවරාගෙන අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු සිදුකර නොතිබුණි.	වෙනත් ආයතන නමින් ලියාපදිංචි වී ඇති වාහන අතුරින් වාහන 12 ක අයිතිය මේ වන විට අප දෙපාර්තමේන්තුව වෙත පවරාගෙන ඇති අතර අනිකුත් වාහන වල අයිතිය පවරා ගැනීමට අදාල ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ.	දෙපාර්තමේන්තුවට අයිතිය නොමැති වාහන පවරා ගැනීම හෝ අදාළ ආයතන වෙත නිදහස් කිරීමට කටයුතු කළ යුතුය.

4.6 අනාර්ථික ගනුදෙනු

විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
පුත්තලම දිස්ත්‍රික්කයේ තත්ත්ව පරික්ෂණාගාරයක් 2017 වර්ෂයේදී පුත්තලම ගොවිජන සේවා මධ්‍යස්ථානය තුළ ස්ථාපිත කර ඒ සඳහා රු.768,698 ක් වැය කර තත්ත්ව පාලනාගාරයක් සඳහා උචිත පරිදි ප්‍රතිසංස්කරණය කර එම වර්ෂයේදීම රු.3,629,101 ක් වැය කරමින් උපකරණ තොගයක් මිලදී ගෙන තිබුණි. තත්ත්ව පාලනාගාරය තුළ කිසිදු පරික්ෂණයක් සිදු නොකර එම උපකරණ නිෂ්කාර්යව පැවතුණු අතර, උපකරණවල ක්‍රියාකාරිත්වය හෝ පරික්ෂා කර නොතිබුණි. මෙම තත්ත්ව පාලනාගාරයේ ඇතුළත් උපකරණ ගොවිජන දිස්ත්‍රික් සංවර්ධන කාර්යාලයේ හෝ ගොවිජන සේවා කාරක සභාවේ තොග පොත්වල ද ඇතුළත් කර නොතිබුණි. ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ 2023 ජුනි 08 දිනැති අංක 05/2023 දරන ඉදිකිරීම් තත්ත්ව පරික්ෂණ සේවා චක්‍රලේඛය අනුව තත්ත්ව පරික්ෂණාගාරය ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණික නිලධාරියකු ස්ථානභාර නිලධාරී ලෙස පත් කර තිබුණි. 2023 නොවැම්බර් හා දෙසැම්බර් මාසවල දී තත්ත්ව පාලනාගාරවලට අදාළ පස් පරික්ෂණ හා අමුද්‍රව්‍ය පරික්ෂණ සඳහා පැවැත්වූ පුහුණු සඳහා පුත්තලම දිස්ත්‍රික්කය වෙනුවෙන් ස්ථානභාර නිලධාරී ඇතුළු තාක්ෂණික නිලධාරින් දෙදෙනෙකු සහභාගී වී තිබුණි.	ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය තුළ රාජකාරියේ නියුතු තාක්ෂණ නිලධාරීන් දෙදෙනෙකු පමණක් සීටීම හේතුවෙන් හා ඔවුන් වෙත පැවරී ඇති අධික රාජකාරි මත මෙම තත්ත්ව පාලනාගාරය ක්‍රියාත්මක කිරීමට අපහසු විය. නමුත් 2025 වර්ෂයේ සිට මෙම පාලනාගාරය ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගනු ලැබේ. අදාල උපකරණ ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලයේ භාණ්ඩ වට්ටෝරු ලේඛනයට ඇතුළත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ.	නිෂ්කාර්යව පවතින තත්ත්ව පාලනාගාරය විධිමත් පරිදි පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය.

4.7 **කළමනාකරණ දුර්වලතා**

	විගණන නිරීක්ෂණය	ගණකාධිකාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	බදුල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 3 ක නිලධාරින් තිදෙනෙකු විසින් සිදු කර තිබූ අයථා පොහොර පරිහරණය කිරීමට අදාළව ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් ලබාදී තිබුණු විනය නියෝගය අනුව රු.මිලියන 12.28 ක මුදලක් අයකර ගත යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන විටද එම මුදල අයකර ගැනීමට අදාල ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් හෝ ගණකාධිකාරිවරයා කටයුතු කර නොතිබුණි.	සේවයෙන් පහ කරන ලද ගොවිජන සංවර්ධන නිලධාරී හා මධ්‍යස්ථාන කළමනාකරණ වෙතින් අය විය යුතු මුදල් අය කර ගැනීම සඳහා නීතිමය උපදෙස් ප්‍රකාරව කටයුතු කරනු ලැබේ.මධ්‍යස්ථාන ලිපිකරු වෙතින් අය විය යුතු මුදල ඔහුගේ විශ්‍රාම වැටුපෙන් හා විශ්‍රාම පාරිතෝශිතයෙන් අය කර ගැනීම, නිලධාරියාගේ විශ්‍රාම පාරිතෝශිතය අනුමත වීමෙන් අනතුරුව සිදු කරන බව දන්වා ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් (බදුල්ල)ගේ දන්වා ඇත. ඒ අනුව ඒ සම්බන්ධ ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ.	විනය නියෝගය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	බත්මැඩිල්ල ගොවිජන බැංකුවේ සේවය කළ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරියකු සම්බන්ධයෙන් පවත්වන ලද මූලික විමර්ශනයට අනුව ආසන්න වශයෙන් රු.මි. 5 ක් පමණ මුදලක් අවභාවිතා කර ඇති බව නිරීක්ෂණය කර තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විටද පසු විපරම් කටයුතු කර අදාල මුදල් එම නිලධාරියාගෙන් අයකර ගැනීමට කටයුතු නොකර එම නිලධාරියා තව දුරටත් රාජකාරියේ යොදවා තිබුණි. ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ අංක 7/2/15/උ.ස/බදුල්ල හා 2022 ඔක්තෝබර් 17 දිනැති ලිපිය මගින් මෙම නිලධාරියාට 2019 මැයි 03 දින සිට ක්‍රියාත්මක වන පරිදි කෘෂිකර්ම පර්යේෂණ හා නිශ්පාදන සහකාර සේවයේ 1 වන ශ්‍රේණියට උසස් වීමක්ද ලබා දී තිබුණි.	බත්මැඩිල්ල ගොවිජන නියමු ව්‍යාපෘතියේ සිදුව ඇති මුදල් අක්‍රමිකතා සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් සිදු කිරීම සඳහා නුවරඑළිය සංවර්ධන නිලධාරී පත් කර ඇති අතර මූලික විමර්ශන වාර්තාව ලද විගස අදාල ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ.	මුදල් අවභාවිතා සම්බන්ධ මූලික විමර්ශන කටයුතු කඩිනමින් සිදු කළ යුතුය.
(ඇ)	තොරතුරු කළමනාකරණ ඒකකය යටතේ ඩිජිටල් කුඹුරු ඉඩම් නාමලේඛන ප්‍රතිශෝධන වැඩසටහන 2022 වර්ෂයේ ආරම්භ කර ඇති අතර වර්තමානය වන විටත් අවසන් කර නොතිබුණි. මෙම වැඩසටහන යටතේ කුඹුරු ඉඩම් වර්ගීකරණය කර හඳුනා ගත නොහැකි අතර ඉදිරිපත් කළ දත්ත අනුව 2024 වර්ෂය අවසන් වන විට දිවයිනේ දිස්ත්‍රික්ක 24 කට අදාළව ගොවිජන සේවා මධ්‍යස්ථාන 145 ක	14,021 ක් වූ ග්‍රාම නිලධාරී වසම් වලට අදාළව 10,400ක් වූ කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර වසම් අතුරින් වසම් 410ක සංඛ්‍යාව වෙනස්වීම් හා නොගැලපීම් වාර්තා විය. ඒ පිළිබඳ අධ්‍යයනය කර විෂමතා පවතින වසම් ලැයිස්තුව සකස්කර පද්ධතියේ දැනට පවතින දත්ත වල ස්ථානය පෙළගැස්මට හානි නොවන පරිදි පද්ධතිය තුළ නැවත යාවත්කාලීන කිරීම සඳහා පද්ධති නිර්මාණය හා සංවර්ධන කණ්ඩායම් වෙත ලබා දී ඇති අතර එම නිවැරදි කිරීමේ කාර්යයන් මේ වන විට සිදු කරමින්	ඩිජිටල් කුඹුරු ඉඩම් නාමලේඛන ප්‍රතිශෝධන වැඩසටහන සිදු කළ යුතුය.

	කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර වසම් 410 ක කුඹුරු ඉඩම් පිළිබඳ තොරතුරු දත්ත පද්ධතියට ඇතුළත් වී නොතිබුණි.	පවතී.	
(ඇ)	කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගොවීන් 23,558 ක් විසින් වී වගා කරන කුඹුරු අක්කර 16,998 ක් පෝෂණය කරන අමුණු සංඛ්‍යාව 1,222 ක් වන අතර ගොවිජන සේවා මධ්‍යස්ථාන 16 කට අයත් ඉන් අක්‍රීය තත්ත්වයේ ඇති අමුණු 100 ක් අත්හැර දමා තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ අමුණු 12 ක් හා ඊට අදාළ ඇළවේලි ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කර තිබුණ ද අක්‍රීය තත්ත්වයේ ඇති අමුණු ක්‍රියාකාරී තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි.	කුරුණෑගල දිස්ත්‍රික් ගොවිජන සේවා බල ප්‍රදේශ පනස් හයකින් යුක්ත වන අතර සියලුම ගොවි ජන සේවා මධ්‍යස්ථානවලට අදාලව ප්‍රතිසංස්කරණ යෝජනා ඉදිරිපත් වන නමුත් එම සියලුම යෝජනා ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් මුදල් වෙන් නොවූ බැවින් 2024 වර්ෂයේ කුරුණෑගල දිස්ත්‍රික්කය වෙත වෙන්කරන ලද ප්‍රතිපාදන සීමාව තුළ අවශ්‍යතාව හා ප්‍රමුඛතාවය මත සිදුකළ යුතු අත්‍යාවශ්‍ය ව්‍යාපෘති ප්‍රතිසංස්කරණය කරන ලදී.	ප්‍රමුඛතාවය මත ප්‍රතිපාදන වෙන් කරවා ගෙන අදාළ ප්‍රතිසංස්කරණ සිදු කළ යුතු ය.
(ඉ)	කුරුණෑගල දිස්ත්‍රික්කයේ වී වගාව සහ වෙනත් කෘෂිකාර්මික වගාවන් සඳහා ඉදි කර ඇති කෘෂි ළිං ප්‍රමාණය 4,765 කින් ළිං 513 ක් අක්‍රීය තත්ත්වයේ පැවතියද සමාලෝචිත වර්ෂය තුළ ඒවා ප්‍රතිසංස්කරණය සඳහා කටයුතු කර නොතිබුණි.	විවිධ අවස්ථාවලදී ගොවිජන සේවා මධ්‍යස්ථාන මට්ටමෙන් තොරතුරු ලබා ගන්නා විට මෙම ප්‍රමාණයන් දක්වා තිබුණද ප්‍රතිසංස්කරණ යෝජනාවන් ලෙස කෘෂි ළිං පිළිබඳ යෝජනා මධ්‍යස්ථාන මට්ටමින් ඉදිරිපත් වී නොමැත.	ප්‍රතිසංස්කරණය කළ යුතු කෘෂි ළිං හඳුනාගෙන ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කළ යුතුය.
(ඊ)	ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද 2018 අප්‍රේල් 27 දිනැති අංක 07/2018 චක්‍රලේඛය අනුව 2015/2017 වර්ෂ වල ක්‍රියාත්මක වූ කෘෂිකාර්මික ඉඩම් (කුඹුරු) ලේඛන ප්‍රතිශෝධන වැඩසටහනේදී නැවත වරක් වී වගා කල හැකි, ඉඩම් ගොඩ කිරීම/ කෘෂිකාර්මික නොවන වෙනත් කාර්යයක යෙදවීමට අවසර ලබා නොදිය යුතු A ශ්‍රේණියේ පුරන් කුඹුරු ලෙස හඳුනාගෙන තිබුණු කොළඹ දිස්ත්‍රික්කයේ පර්චස් 548.05ක කුඹුරු ඉඩම් ප්‍රමාණයක් උක්ත චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව වෙනත් කාර්යයන් සඳහා යෙදවීමට හෝ ගොඩකිරීමට අවසර ලබා දී තිබුණි.	2023.03.07 දින පැවති කෘෂිකර්මය පිළිබඳ පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවේදී ගනු ලැබූ තීරණය පරිදි 2023.03.08 දින සිට කුඹුරු ඉඩම් ප්‍රමාණයක් වී වගා කිරීමක් හැර වෙනත් කාර්යයක් සඳහා යෙදවීමට අවසර ලබා දීමට අදාළ 7/2018 චක්‍රලේඛය තාවකාලිකව අත්හිටුවා ඇත. කෙසේ වෙතත් උක්ත තීරණය මගින් කුඹුරු ඉඩම්වල කාණ්ඩ සංශෝධනයන්ට අදාළව නිකුත් කර ඇති 6/2018 සහ 4/2019 යන චක්‍රලේඛයන් අහෝසි කිරීමක් සිදු නොකළ බැවින් එකී චක්‍රලේඛ යටතේ ලැබී ඇති නිර්දේශ සම්බන්ධයෙන් සලකා බලා 2011 අංක 46 දරන ගොවිජන සංවර්ධන (සංශෝධන) පනතින් සංශෝධිත 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව කුඹුරු ඉඩම් වෙනත් කාර්යයක් සඳහා යෙදවීමට අදාළව ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්වරයා විසින් අදාළ අනුමැතිය ලබා දී ඇත.	පුරන් කුඹුරු ගොඩ කිරීමට අවසර ලබාදීමේදී චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

(උ)	2018 අංක19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ගොවිජන සේවා කාරක සභාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇත. ඒ අනුව ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය සහ සහකාර කොමසාරිස්වරුන්ගේ 2024 මැයි 03 හා 04 දිනයන්හි දී පැවැත් වූ සමුළුවට ගොවිජන සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස්,නුවරඑළියගේ 2024 අප්‍රේල් 22 දිනැති ලිපිය ප්‍රකාරව ගොවිජන සේවා කාරක සභාවේ, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන සමුළුවේ වියදම් දැරීම සඳහා රු.945,000ක් ගොවිජන සේවා මධ්‍යස්ථාන 12ක් ද ගොවි සංවිධාන බල මණ්ඩල මඟින් රු.200,000ක් ද පුද්ගලික සමාගම් මඟින් රු.378,000ක් හා විදුලිපුර ගොවිජන සේවා මධ්‍යස්ථානයේ නිලධාරීන් සහ ගොවීන්ගෙන් පෞද්ගලිකව රු.30,000ක් ලෙස මුළු වටිනාකම රු1,553,000ක් ගෙවීම් කර තිබුණි.	සත්භාවයෙන් රැස්වීම පවත්වාගෙන යාමට දුන් මුදලක් බව හා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය කොමසාරිස්ගේ උපදෙස් මත කටයුතු කර ඇති බව.	ගොවිජන සේවා බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන වියදම් නොදැරිය යුතුය.
(ඌ)	කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ඇති මුළු වැව් සංඛ්‍යාව 5,636 කින් ගොවිජන සේවා මධ්‍යස්ථාන 24 කට අදාළව ප්‍රයෝජනයට ගත නොහැකි අක්‍රීය වී ඇති වැව් 149 ක් අතහැර දමා තිබුණද එම වැව් යටතේ කුඹුරු අක්කර 108,413 ක් පෝෂණය වන අතර ගොවීන් සංඛ්‍යාව 125,063 වේ. එසේ වුවද, සමාලෝචිත වර්ෂය තුළ අත්හැරී ඇති වැව් 02 ක් පමණක් ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කර තිබුණ අතර වැව් 147 ක් ප්‍රයෝජනයට ගත හැකි වනසේ ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කර නොතිබුණි.	අතහැරදමා ඇති වැව් විශාල ප්‍රමාණයක් තිබුණ ද ප්‍රතිසංස්කරණය සඳහා ලැබී ඇති ප්‍රතිපාදන එම සියළු වැව් ප්‍රතිසංස්කරණය සඳහා ප්‍රමාණවත් නොවන බැවින් අවශ්‍යතාව හා ප්‍රමුඛතාව මත අදාල ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කරනු ලැබේ.	ප්‍රමුඛතාවය මත වැව් ප්‍රතිසංස්කරණයන් සිදු කළ යුතුය.
(එ)	දෙපාර්තමේන්තුව සතු ගොවිජන සේවා මධ්‍යස්ථාන 482 කට අයත් ඉඩම් හා ගොවිජන සේවා මධ්‍යස්ථාන 74 කට අයත් ගොඩනැගිලි වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.	ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ.	ඉඩම් හා ගොඩනැගිලි පවරාගෙන තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය.

5. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

	විගණන නිරීක්ෂණය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	කුරුණෑගල දිස්ත්‍රික්කයේ අත්හල වැව් ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ ඉබ්බාවල වැව ප්‍රතිසංස්කරණය සඳහා රු.මිලියන 8.15 ක් 2024 වර්ෂය තුළ වැය කර තිබුණි. එම වැව ප්‍රතිසංස්කරණ වැඩ බිමට ගෙන ගිය ප්‍රමිතියෙන් තොර බවට තත්ත්ව පරික්ෂාවේ දී තහවුරු වූ වැලි කියුබ් 21 ක ප්‍රමාණය නැවත ආපසු ගෙන ගිය බවට හා ඒ සඳහා ප්‍රමිතියෙන් යුතු වැලි ලද බවටත්, වැඩ බිම සඳහා ලබා ගත් අමුද්‍රව්‍යවල තත්ත්වයන් පරික්ෂා කළ බවටත්, වැව් බැම්ම සඳහා යොදා ගත් වැව තුළ ඇති පස්වල ගුණාත්මකභාවය පරික්ෂා කළ බවටත්, කොන්ක්‍රීට් යොදා ඉදි කර තිබුණු සොරොව්ව හා පිටවාන ඇලෙහි යොදා තිබූ කොන්ක්‍රීට්වල තත්ත්වය පරික්ෂා කළ බවටත්, අදාළ පරික්ෂණ වාර්තා ඉදිරිපත් නොවූ අතර වැව් බැම්මෙන් කොටසක් පමණක් පිඩලි අල්ලා තිබීම හා ප්‍රතිසංස්කරණය කිරීමේදී ඉවත් කරන ලද පස් කියුබ් 918 ක් මිලදී ගත් අය විසින් ඉවත් කර නොගෙන වැව තුළ ස්ථාන 04 ක කඳු වශයෙන් ගොඩ ගසා තිබූ බැවින් ඒවා නැවත වැව තුළ තැන්පත්වීමට ඉඩ ඇති බවත් නිරීක්ෂණය විය.	කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉබ්බාවල වැව, පාළු වැව හා වරා වැව සඳහා යොදාගත් කොන්ක්‍රීට් මිශ්‍රණවල ප්‍රමිතිය හා සම්පිණ්ඩන ශක්තිය පිළිබඳව පරීක්ෂාකර වාර්තා කරන ලෙස අධ්‍යක්ෂ (ඉංජිනේරු) වෙත දන්වන ලදී. ඒ අනුව ලද වාර්තාවේ උක්ත ව්‍යාපෘති සඳහා යොදාගත් කොන්ක්‍රීට් මිශ්‍රණවල ප්‍රමිතිය හා සම්පිණ්ඩන ශක්තිය ප්‍රමාණවත් පරිදි පවතින බවත් පස්වල Compaction අගයන්ද අවශ්‍ය අගයෙන් පවතින බවත් නිර්දේශ කර ඇත. එම වාර්තාවේ පිටපතක් අමුණා ඇත. ඉබ්බාවල වැවෙහි බැම්ම සඳහා පිඩලි වරා වැවෙන් කපාගත් බවත් අධික වර්ෂාව හේතුවෙන් පිඩලි සපයා ගැනීම දුෂ්කර වී ඇත. එසේම මේ වන විට ගෙවීම් කටයුතු සිදුකර ඇත්තේ පිඩලි ඇල්ලූ ප්‍රදේශය සඳහා පමණක් බවත් පස් වෙන්දේසිකර අවසන් වූ පසු අධික වර්ෂාපතනය හේතුවෙන් ගැණුම්කරුවන්ට පස් ඉවත් කිරීමට නොහැකි වී ඇත. ගැණුම්කරුවන්ට එම පස් ඉවත් කර ගැනීමට කටයුතු කරන ලෙස දන්වා ඇත. පාළු වැවෙහි ද පස් වෙන්දේසි කර ඇති අතර ගැණුම්කරුවන් විසින් පස් ඉවත්කර ගෙන අවසන්වීමට ප්‍රථම වැසි ආරම්භ වීම හේතුවෙන් පස් එම වැව මත ගොඩ ගසා ඇත. ගැණුම්කරුවන්ට එම පස් ඉවත් කර ගැනීමට කටයුතු කරන ලෙස දන්වා ඇත.	වැව් ප්‍රතිසංස්කරණ කටයුතු නියමිත පරිදි සිදු කළ යුතුය.
(ආ)	කුරුණෑගල දිස්ත්‍රික්කයේ අත්හල වැව් ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ පාළු වැව ප්‍රතිසංස්කරණය සඳහා රු.මිලියන 5.93 ක් 2024 වර්ෂය තුල වැය කර තිබුණි. වැව් ප්‍රතිසංස්කරණයේ දී ගොවිජන සංවර්ධන කොමසාරිස්ගේ මාර්ගෝපදේශට අනුව පෝෂිත කුඹුරු ප්‍රමාණය අවම වශයෙන් අක්කර 20 ක්වත් විය යුතු නමුත් මෙම වැව යටතේ ඇති කුඹුරු ප්‍රමාණය අක්කර 13 ක් පමණ වන අතර ඇස්වැද්දීම අක්කර 09 කට සීමා වී තිබුණි. වැව් බැම්ම සඳහා වැවේ පස් යොදා ගෙන තිබූ නමුත් එහි ගුණාත්මක තත්ත්වය පරික්ෂා කළ බවට තොරතුරු ඉදිරිපත් නොවුණි. වැවෙහි සීමාවන් නියමිත පරිදි හඳුනා ගෙන නොතිබුණ අතර පැරණි වැව් බැම්මට පස්	කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉබ්බාවල වැව පාළු වැව හා වරා වැව සඳහා යොදාගත් කොන්ක්‍රීට් මිශ්‍රණවල ප්‍රමිතිය හා සම්පිණ්ඩන ශක්තිය පිළිබඳව පරීක්ෂාකර වාර්තා කරන ලෙස අධ්‍යක්ෂ (ඉංජිනේරු) වෙත දන්වන ලදී. ඒ අනුව ලද වාර්තාවේ උක්ත ව්‍යාපෘති සඳහා යොදාගත් කොන්ක්‍රීට් මිශ්‍රණවල ප්‍රමිතිය හා සම්පිණ්ඩන ශක්තිය ප්‍රමාණවත් පරිදි පවතින බවත් පස්වල Compaction අගයන්ද අවශ්‍ය අගයෙන් පවතින බවත් නිර්දේශ කර ඇත. ඉබ්බාවල වැවෙහි බැම්ම සඳහා පිඩලි වරා වැවෙන් කපාගත් බවත් අධික වර්ෂාව හේතුවෙන් පිඩලි සපයා ගැනීම දුෂ්කරවීම ඇත. එසේම මේ වන විට ගෙවීම් කටයුතු සිදුකර ඇත්තේ පිඩලි ඇල්ලූ ප්‍රදේශය සඳහා	වැව් ප්‍රතිසංස්කරණය කිරීමේ දී නියමිත පරිදි සිදු කළ යුතු ය.

	දමා සකසා තිබූ බැවින් පිටවාන මඟින් ජලය බැසයාමට ප්‍රථම වැව් බැම්මෙන් ජලය බැස යන බව නිරීක්ෂණය විය. වැවෙහි ඉවත් කළ පස් වැව තුළ ගොඩ ගසා තිබූ බැවින් පස් නැවතත් වැවට එකතුවෙමින් පැවතුණි.	පමණක් බවත් පස් වෙන්දේසිකර අවසන් වූ පසු අධික වර්ෂාපතනය හේතුවෙන් ගැණුම්කරුවන්ට පස් ඉවත් කිරීමට නොහැකිවී ඇත.පාළු වැවෙහි ද පස් වෙන්දේසිකර ඇති අතර වැසි ආරම්භ වීම හේතුවෙන් පස් එම වැව මත ගොඩ ගසා ඇත. ගැණුම්කරුවන්ට එම පස් ඉවත් කර ගැනීමට කටයුතු කරන ලෙස දන්වා ඇත.	
(ඇ)	තිරසර ගෙවතු වගා වැඩසටහන යටතේ ගෙවතු ලක්ෂයක් ඇති කිරීම හා එය තිරසරව පවත්වා ගෙන යාම ඉලක්ක කර ගත් මෙම වැඩසටහන සඳහා කුරුණෑගල දිස්ත්‍රික්කය වෙනුවෙන් රු.මිලියන 45.76 ක ප්‍රතිපාදන වෙන් කර ඉන් රු.මිලියන 16.63 ක බීජ හා රෝපණ ද්‍රව්‍ය වෙනුවෙන් වියදම් කර ඉතිරි රු.මිලියන 29.13 ක් ආපසු පවරා දී තිබුණි. ඒ අනුව ලැබුණු ප්‍රතිපාදනයෙන් සියයට 64 ක්ම උපයෝජනය නොකර ආපසු යවා තිබුණි. කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉලක්කගත ගෙවතු සංඛ්‍යාව 21,200 ක් වූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවතු පිහිටු වීම සඳහා බීජ හා රෝපණ ද්‍රව්‍ය ලබා දුන් ගෙවතු සංඛ්‍යාව 6,299 ක් වූයෙන් ගෙවතු පිහිටුවීමේ ප්‍රගතිය සියයට 30 ක් වැනි ඉතා පහළ මට්ටමක පැවතුණි. මෙම ගෙවතුවලද 2025 ජනවාරි 31 දින වන විටත් වර්තමාන ප්‍රගතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. ගෙවතු නිවැරදිව හඳුනා ගැනීම, නඩත්තු කිරීම හා ගෙවත්ත සාර්ථකව පවත්වා ගෙන යාම සම්බන්ධව නිරන්තර පසුවිපරම් කිරීම, වගා කටයුතු අඩාල වීම වැලැක්වීම සඳහා ගතයුතු සියලු පියවර අධීක්ෂණ නිලධාරින් විසින් ගත යුතු වුවත්, ඒ අනුව, කටයුතු නොකිරීම හේතුවෙන් දරන ලද රු.මිලියන 16.63 ක මුදල නිෂ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි.	පිළිතුරු සපයා නොමැත.	ප්‍රතිපාදනයන් අපේක්ෂිත ඉලක්කයන් සපුරා ගැනීමට කටයුතු කළ යුතුය.

6. මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	ගණකාධිකාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව 19,764 ක් වූ අතර තත්‍ය සේවක සංඛ්‍යාව 13,484 ක් වුයෙන් එම 6,280 ක පුරප්පාඩු නැවත සමාලොචනය කර බඳවා ගැනීමට හෝ සංශෝධනය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	අදාල විගණන නිරීක්ෂණය නිවැරදි වන අතර, ඉදිරියේ දී නිවැරදි කර ගැනීමට පියවර ගනු ලැබේ.	පුරප්පාඩු නැවත සමාලෝචනය කර බඳවා ගැනීම කළ යුතුය.
(ආ)	පොතුහැර කාබනික පොහොර ප්‍රවර්ධන මෙහෙයුම් ඒකකය නමින් 2020 ජුනි 10 ස්ථාපිත කළ ඒකකය 2022 වර්ෂයේ සිට තොරතුරු කළමනාකරණ ඒකකය ලෙස නම් කෙරුන අතර දෙපාර්තමේන්තුවේ සියලුම ඩිජිටල්කරණ සහ තාක්ෂණ කටයුතු මෙහෙයවීම මෙම ඒකකයේ ප්‍රධාන කාර්යය වුවද, ඒ සඳහා සුදුසුකම්ලත් නිලධාරින්ගෙන් අනුයුක්ත වන පරිදි සකස් කළ කාර්යය මණ්ඩලයක් අනුමත කර නොගෙන ආරම්භයේ සිට මේ දක්වා වරින් වර අනුයුක්ත කර ඇති කාර්යය මණ්ඩලය 19 කගෙන් සමන්විත වී තිබුණි.	අනුමත කාර්යය මණ්ඩලය පත් කිරීමට ඉල්ලීම් සිදු කර ඇතත් පොතුහැර තොරතුරු කළමනාකරණ ඒකකය ඇතුළුව දෙපාර්තමේන්තුවේ අංශ කිහිපයක් සඳහා සුදුසුකම්ලත් නිලධාරීන් නොමැති වීම හේතුවෙන් ඒ සඳහා නව කාර්යය මණ්ඩල ප්‍රමාණයක් අනුමත කර ගැනීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇතත්,ඒ සඳහා අනුමැතිය ලැබී නොමැත.එම කටයුතු ඉටු කිරීම සඳහා තාවකාලිකව නිලධාරීන් කණ්ඩායමක් අනුයුක්ත කර දෙපාර්තමේන්තුවේ කටයුතු පවත්වාගෙන යනු ලැබේ.	අදාළ කාර්යයන් සඳහා සුදුසුකම් ලත් නිලධාරීන් බඳවා ගෙන අනුයුක්ත කළ යුතුය.